# <u>WEATHER FORECAST FOR 27th April 2019</u>
## <u>(Issued at 1200 noon on 26th April 2019)</u>

**The depression over southeast Bay of Bengal to the southeast of Sri Lanka is now located near latitude 2.5N, Longitude 89.6E at 08.00 a.m. of 26th April 2019, about 950 km Southeast of Potuvil. It is likely to intensify into a deep depression and then into a cyclonic storm during next 24 hours. The system is very likely to move northwestwards along and off east coast of Sri Lanka.**

Cloudy skies can be expected over most parts of the island.
Showers or thundershowers will occur at several places in Western, Southern, Sabaragamuwa and Central provinces. Showers or thundershowers will occur at several places elsewhere after 2.00 p.m.
Fairly heavy falls about 75 mm can be expected at some places.

**There may be temporary localized strong winds during thundershowers. General public is kindly requested to take adequate precautions to minimize damages caused by lightning activity.**

**General public, Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regards.**

ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් පවතින පීඩන අවපාතය අද උදෑසන 08.00 වන විට පොතුවිල් සිට ගිනිකොණ දෙසින් කි.මී 950 පමණ දුරින් උතුරු අක්ෂාංශ 2.5 ත් නැගෙනහිර දේශාංශ 89.6 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය ඉදිරි පැය 24 තුලදී ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී පසුව සුළි කුණාටුවක් දක්වා වර්ධනය වේ යයි බලාපොරොත්තු වේ. මෙම පද්ධතිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරය ආසන්නයෙන් වයඹ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

දිවයිනේ බොහෝ ප්‍රදේශවල අහස වලාකුළින් බරව පවතිනු ඇත.

බස්නාහිර, දකුණු, සබරගමුව සහ මධ්‍යම පළාත්වල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. සෙසු පළාත්වල තැනින් තැන සවස 2.00 න් පමණ පසුව වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.
ඇතැම් ස්ථානවලට මි.මී.75 ක පමණ තරමක තද වර්ෂාපතනයන් ඇතිවිය හැක.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැක. අකුණු මගින් සිදුවන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් මේ සම්බන්ධව නිකුත් කරන ඉදිරි නිවේදන පිලිබඳ අවධානය යොමුකරන ලෙස මහජනතාවගෙන් සහ ධීවර හා නාවුක ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

## <u>WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS (Issued at 1200 noon on 26th April 2019)</u>

**The depression over southeast Bay of Bengal to the southeast of Sri Lanka is now located near latitude 2.5N, Longitude 89.6E at 08.00 a.m. of 26th April 2019, about 950 km Southeast of Potuvil. It is likely to intensify into a deep depression and then into a cyclonic storm during next 24 hours. The system is very likely to move northwestwards along and off east coast of Sri Lanka.**

Showers or thundershowers will occur at several places in the sea areas off the coast extending from Puttalam to Trincomalee via Colombo and Hambantota.

Winds will be South-easterly in the sea area extending from Kankasanturai to Hambantota via Trincomalee and Batticaloa and winds will be South-westerly to Westerly in direction in the other sea areas around the island.

Wind speed will be (30-40) kmph in the sea areas off the coast extending from Tangalle to Batticaloa via Pottuvil and in the sea areas off the coast extending from Puttalam to Trincomalee via Mannar and Kankasanturai. Wind speed will be (20-30) kmph in the other sea areas around the island.

Wind speed will be (40-50) kmph over the deep sea areas in the Southeast to the Island and can be rough at times as the wind speed can increase up to 60 kmph at times.

**The fishermen are advised not to venture into deep Bay of Bengal sea areas to the southeast of Sri Lanka until further noticed.**

**Naval and fishing communities are requested to be attentive about future advisories issued by the Department of Meteorology in this regard.**

**<u>ඉදිරි පැය 24 සඳහා දිවයින වටා ඇති මුහුදේ කාලගුණ තත්ත්වය</u>**
**<u>2019 අප්‍රේල් මස 26 දින මධ්‍යහන 1200 ට නිකුත් කරන ලදි.</u>**

ගිනිකොණ දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ, ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් පවතින පීඩන අවපාතය අද උදෑසන 08.00 වන විට පොතුවිල් සිට ගිනිකොණ දෙසින් කි.මී 950 පමණ දුරින් උතුරු අක්ෂාංශ 2.5 ත් නැගනහිර දේශාංශ 89.6 ත් ආසන්නව ස්ථානගතව පවතී. මෙම පද්ධතිය ඉදිරි පැය 24 තුලදී ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී පසුව සුළි කුණාටුවක් දක්වා වර්ධනය වේ යයි බලාපොරොත්තු වේ. මෙම පද්ධතිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරය ආසන්නයෙන් වයඹ දෙසට ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පුත්තලම සිට කොළඹ සහ හම්බන්තොට හරහා ත්‍රිකුණාමලය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ.

කන්කසන්තුරය සිට ත්‍රිකුණාමලය සහ මඩකලපුව හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළං ගිනිකොණ දෙසින් හමන අතර දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල වල සුළං නිරිත සිට බස්නාහිර දක්වා වන දිශා වලින් හමා එයි.

තංගල්ල සිට පොතුවිල් හරහා මඩකලපුව දක්වා වන මුහුදු ප්‍රදේශවල සහ පුත්තලම සිට මන්නාරම සහ කන්කසන්තුරය හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. 30-40 පමණ වේ.

දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. 20-30 පමණ වේ.

ගිනිකොණ දෙසින් ගැඹුරු මුහුදු ප්‍රදේශවල පැ.කි.මී (40-50) දක්වා වන සුළං සමඟ විටින් විට හමන පැ.කි.මී 60 දක්වා වන ප්‍රහාරාත්මක සුළං බලාපොරොත්තුවේ. එම මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ.

ශ්‍රී ලංකාවට ගිනිකොණ දෙසින් වන ගැඹුරු බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ අද සිට ධීවර සහ නාවුක කටයුතු වලින් වලකින ලෙස ධීවරයන්ට උපදෙස් දෙනු ලැබේ.

කාලගුණ විද්‍යාඥ (Duty Meteorologist),
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව (Department of Meteorology)

EMERGENCY OPERATIONS DIVISION
RECEIVED
Date : 2019/04/26
Time : 13:05
D (Ops)/DO/ADO
DISASTER MANAGEMENT CENTRE